# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

අංක 2280/34 - 2022 මැයි මස 18 වැනි බදාදා - 2022.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ගොනු අංකය*: GAL/LAN/ACQUIS/A13/36.
*ඉඩම් අමාත්‍යාංශ අංකය*: 4-3/15/2017/VE/521.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 60 බී ලාහුපන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තැඹිලිපිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මු. පි. කෑ. 3843 හා 2022.03.31 දිනැති පිඹුර අනුව මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 3.3067ක් වූ පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම් කොටස් :

**උපලේඛනය**

**කැබලි අංක 01 - ඉඩමේ නම: හිග්ගොඩවත්ත; ප්‍රමාණය: හෙක්. 0.2576**

*උතුර*: මාර්ගය, කෑ 3613 වැනි මූලික පිඹුරේ 10 වැනි බිම් කැබැල්ල, පී. ජී. සේන අභයවික්‍රම හා තවත් අය හිමිකම් කියන පොලදණ්ඩ පිල්ලැව; *නැගෙනහිරට*: පී. ජී. සේන අභයවික්‍රම හා තවත් අය හිමිකම් කියන පොලදණ්ඩ පිල්ලැව සහ A892 වැනි මූලික පිඹුරේ 21 වැනි බිම් කැබැල්ල; *දකුණට*: A 892 වැනි මූලික පිඹුරේ 21 වැනි බිම් කැබැල්ල; *බටහිරට*: A 892 වැනි මූලික පිඹුරේ 21 වැනි බිම් කැබැල්ල (මාර්ගය) සහ කෑ 3613 වැනි මූලික පිඹුරේ 10 වැනි බිම් කැබැල්ල.

**කැබලි අංක 02 - ඉඩමේ නම: හිග්ගොඩවත්ත; ප්‍රමාණය: හෙක්. 2.9731**

*උතුරට*: කෑ 3614 වැනි මූලික පිඹුරේ 109 වැනි බිම් කැබැල්ල, කෑ. 3613 වැනි මූලික පිඹුරේ 14 වැනි බිම් කැබැල්ල, කෑ 3614 වැනි මූලික පිඹුරේ 102, 101, 99 වැනි බිම් කැබලි, කෑ 3613 වැනි මූලික පිඹුරේ 12 වැනි බිම් කැබැල්ල, කෑ. 3614 වැනි මූලික පිඹුරේ 97, 96, වැනි බිම් කැබැල්ල A 892 වැනි මූලික පිඹුරේ 21 වැනි බිම් කැබැල්ල (මාර්ගය) ; *නැගෙනහිරට*: A 892 වැනි මූලික පිඹුරේ 21 වැනි බිම් කැබැල්ල (මාර්ගය); *දකුණට*: A 892 වැනි මූලික පිඹුරේ 21 වැනි බිම් කැබැල්ල; *බටහිරට*: A 892 වැනි මූලික පිඹුරේ 21 වැනි බිම් කැබැල්ල සහ කෑ 3614 වැනි මූලික පිඹුරේ 109 වැනි බිම් කැබැල්ල.

**කැබලි අංක 03 - ඉඩමේ නම: -; ප්‍රමාණය: හෙක්. 0.0201**

*උතුරට*: මාර්ගය; *නැගෙනහිරට*: මාර්ගය; *දකුණට*: මාර්ගය; *බටහිරට*: මාර්ගය

**කැබලි අංක 04 - ඉඩමේ නම: -; ප්‍රමාණය: හෙක්. 0.0559**

*උතුරට*: මාර්ගය; *නැගෙනහිරට*: මාර්ගය; *දකුණට*: මාර්ගය; *බටහිරට*: මාර්ගය


1A - G 36790 – 17(2022/05)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

හිමිකම් කියන අය :

1.සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක සී 82, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07.

සම්පූර්ණ බිම් ප්‍රමාණය හෙක්. 1.3988

ඉහත නම් සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022.07.18 වැනි දින පූ. භා. 10.00ට ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2022.07.04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

එච්. එම්. සී. සුසන්ත හේරත්,
ප්‍රාදේශීය ලේකම් ,
ගලිගමුව.

2022 මැයි මස 09 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 05- 0089

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.